## 62 – හරවා කන් ඔබගේ

හරවා කන් ඔබගේ පිළිතුරු දෙනු සමිඳේ
ගැත්තා අසරණයා හිගකම් අඳුනන්නා
පණ මගේ රැකැ ගන්නේ ඔබෙ හිතවතා අනේ
ගැත්තා ගලවන්නේ හේ ඔබ අදහන්නේ

පෙන්නා දෙනු මට සමිඳණෝ
යන්නට ඔබෙ හරි මග දිග'නේ //

මගෙ දෙව්සුරු ඔබනේ – මට කරුණා වන්නේ
දිගටමැ දවස පුරා – සිටිනෙමි ඔබට'ඬගා
ඔබෙ ගැතුනට සමිඳේ – තොස වඩවා දෙන්නේ
ඔසොවමි ඔබට මගේ – අත් බව සමිඳානේ

ඔබෙ හද උණුවන්නේ – කරුණාවෙන් පිරුණේ
උදහස ඔබ සමිඳේ – නැ නැ දක්වන්නේ
දයාව උතුරන්නේ – ඇත්තේ ඉසුරානේ
මා වෙත හැරී බලා – මට දක්වනු කරුණා

ඔබෙ දැස්සගේ පුතා – දිරි ගන්වා ගලවා
ඔබගේ පිය ඇලුමේ – ලකුණක් මා සඳහා
මගෙ සතුරන් හට පා – උන් විළියෙන් පුරවා
ඔබ මා සනසන්නේ – වනු මට පිලිසරණේ